# <u>බස්නාහිර පළාත්</u>
# <u>අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන</u>
## කරදියාන මිහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ
## <u>පුරප්පාඩු රසායනාගාරභාර නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ දැන්වීමයි</u>

බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් වන කරදියාන මිහිසරු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ පුරප්පාඩුව පවතින රසායනාගාර භාර නිලධාර තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රසායනාගාර භාර නිලධාරී**

| | |
|---|---|
| පත්වීමේ ස්වභාවය | : දෛනික |
| දෛනික වේතනය | : රු.4,200/- |
| අධ්‍යාපන සුදුසුකම් | : කෘෂිකර්මාන්තය ආශ්‍රිත ක්ෂේත්‍රයක විද්‍යාවේදී උපාධියක් සහ වසර දෙකක සේවා පළපුරුද්ද. ක්ෂුද්‍රජීව විද්‍යාවේ රසායනික විශ්ලේෂණය සම්බන්ධයෙන් රසායනාගාරයක සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. |

<u>බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ</u>.

### <u>වයස් සීමාව</u>

අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට හෝ රාජ්‍ය හෝ පලාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ට බල නොපැවැත්වේ.

### <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව හෝ දන්වා එවනු නොලැබේ.

### <u>වෙනත් කරුණු</u>

ඔබ විසින් සකස් කරන ලද අයදුම්පතෙහි ඇතුලත් කරනු ලබන අධ්‍යාපන සුදුසුකම් සහ පලපුරුද්දට අදාල සහතිකපත්වල පිටපත් අයදුම්පත සමග ලියා පදිංචි තැපෑලෙන් 2026.02.09 වන දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. ලියුම් කවරයේ **<u>වම් පස ඉහළ කෙලවරේ අදාල තනතුර සඳහන් කල යුතුය</u>**. රාජ්‍ය ආයතනයන්හි අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය වේ. සුදුසුකම් සපුරා නොමැති, නිසිලෙස සම්පූර්ණ කර නොමැති සහ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**<u>ඉල්ලුම්පත් යොමුකල යුතු ලිපිනය</u>**

සභාපති,
අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.),
කරදියාන, තුම්බෝව්ල, පිළියන්දල.

2026.01.27